# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2463/12 – 2025 නොවැම්බර් මස 18 වැනි අඟහරුවාදා – 2025.11.18**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2025 අංක 114 දරන ආඥාව**

මගේ යොමු අංකය : 4-3/6/2025/LRB/07.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය : KSWD&EIP/ACQ/SMC/07.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය, කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම පහත සඳහන් උපලේඛනයේ I වන ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ II වන ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

**කේ. ඩී. ලාල් කාන්ත,**
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම්
සහ වාරිමාර්ග අමාත්‍ය.

2025 නොවැම්බර් මස 12 වැනි දින,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
ඉඩම් මහ ලේකම් කාර්යාලය,
මිහිකත මැදුර, අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

I. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි. -** කොළොන්නාව වැසි ජලය අපවහන හා පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය.

II. **ඉඩමේ විස්තරය. -** බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 503A, මුල්ලේරියාව දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, අංගොඩ, මුල්ලේරියාව (කොට්ඨාස අංක 11- මුල්ලේරියාව, කොටිකාවත්ත-මුල්ලේරියාව ප්‍රාදේශීය සභා සීමාව තුළ) ගම්වල පිහිටි, සර්වේයර් ජනරාල්ගේ අංක CO/DSO/2025/215 හා 2025.08.28 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුත් ඉඩම් කොටස්වලට මායිම්:

**1. කැබලි අක්ෂර ‘A’ - දොඹගහකුඹුර, බෝගහකොටුව, කොන්ගස්ගොඩැල්ල බටහිර දාසයෙන් පංගු දෙක සහ කොන්ගස්ගොඩැල්ලවත්ත - ප්‍රමාණය: හෙක්. 0.1186**

උතුරට: හිමිකම් කියන්නා සහ ඉඩමේ නම සොයාගත නොහැකි ඉඩම, ලියනගේ කරුණාසේන සහ දියපොට අමරතුංගගේ බුද්ධිකා ප්‍රියදර්ශනී හිමිකම් කියන ගොඩැල්ල පාරේ වරිපනම් අංක 56 දරන කොන්ගස්ගොඩැල්ල; නැගෙනහිරට: ලියනගේ කරුණාසේන සහ දියපොට අමරතුංගගේ බුද්ධිකා ප්‍රියදර්ශනී හිමිකම් කියන ගොඩැල්ල පාරේ වරිපනම් අංක 56 දරණ කොන්ගස්ගොඩැල්ල, හිමිකම් කියන්නා සහ ඉඩමේ නම සොයාගත නොහැකි ඉඩම සහ ලියනගේ දයාවංශ පෙරේරා හිමිකම් කියන ගොඩැල්ල පාරේ වරිපනම් අංක 68/13 දරන



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

කොන්ගස්ගොඩැල්ලවත්ත සහ මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර B; දකුණට: කැබලි අක්ෂර C (සැළලිහිණි මාවත ඇළේ කොටසක්); බටහිරට: පී.ජ් පීරිස් හිමිකම් කියන නාරංගොඩ පාරේ වරිපනම් අංකය සොයාගත නොහැකි දොඹගහකුඹුර සහ හිමිකම් කියන්නා සහ ඉඩමේ නම සොයාගත නොහැකි ඉඩම .

**2. කැබලි අක්ෂර 'B' - කොන්ගස්ගොඩැල්ලවත්ත වරිපනම් අංකය - 555 ගොඩැල්ල පාර - ප්‍රමාණය: හෙක්. 0.0008**

උතුරට: කැබලි අක්ෂර A සහ ලියනගේ දයාවංශ පෙරේරා හිමිකම් කියන ගොඩැල්ල පාරේ වරිපනම් අංක 68/13 දරන කොන්ගස්ගොඩැල්ලවත්ත; නැගෙනහිරට: ලියනගේ දයාවංශ පෙරේරා හිමිකම් කියන ගොඩැල්ල පාරේ වරිපනම් අංක 68/13 දරන කොන්ගස්ගොඩැල්ලවත්ත; දකුණට සහ බටහිරට: කැබලි අක්ෂර A.

**3. කැබලි අක්ෂර 'D' - දොඹගහකුඹුර - ප්‍රමාණය: හෙක්. 0.0006**

උතුරට: මාර්ගය සහ මෙම ඉඩමේ ඉතිරි කොටස; නැගෙනහිරට: මෙම ඉඩමේ ඉතිරි කොටස සහ කැබලි අක්ෂර C; දකුණට: කැබලි අක්ෂර C; බටහිරට: කැබලි අක්ෂර C සහ මාර්ගය .

**4. කැබලි අක්ෂර 'E' - හකුරුකුඹුර සහ ඕවිට වරිපනම් අංකය - 12/60 නාරංගොඩ පාර - ප්‍රමාණය: හෙක්. 0.0003**

උතුරට: මාර්ගය සහ සැළලිහිණි මාවත ඇළේ කොටසක්; නැගෙනහිරට: කැබලි අක්ෂර C (සැළලිහිණි මාවත ඇළේ කොටසක්) ; දකුණට: කැබලි අක්ෂර C (සැළලිහිණි මාවත ඇළේ කොටසක්) සහ මෙම ඉඩමේ ඉතිරි කොටස; බටහිරට: මෙම ඉඩමේ ඉතිරි කොටස සහ සිමෙන්ති කාණුව.

**5. කැබලි අක්ෂර 'F' - හකුරුකුඹුර (කොටසක්) සහ ඇස්සුද්දාවල කුඹුර - ප්‍රමාණය: හෙක්. 0.2040**

උතුරට: කැබලි අක්ෂර C (සැළලිහිණි මාවත ඇළේ කොටසක්); නැගෙනහිරට: කැබලි අක්ෂර C (සැළලිහිණි මාවත ඇළේ කොටසක්) සහ හිමිකම් කියන්නා සහ ඉඩමේ නම සොයාගත නොහැකි ඉඩම; දකුණට: හිමිකම් කියන්නා සහ ඉඩමේ නම සොයාගත නොහැකි ඉඩම,මුල්ලේරියාව, සිරිපැරකුම් මාවතේ, අංක 499/3/K/5 හි පදිංචි වික්‍රමසිංහ ආරච්චිලාගේ කාන්ති පෙරේරා හිමිකම් කියන වරිපනම් අංකය සොයාගත නොහැකි ඇස්සුද්දාවල කුඹුර, හිමිකම් කියන්නා සහ ඉඩමේ නම සොයාගත නොහැකි ඉඩම, ඒ.එච්.පී. විමලරත්න හිමිකම් කියන ගොඩැල්ල පාරේ වරිපනම් අංකය සහ ඉඩමේ නම සොයාගත නොහැකි ඉඩම, ජී.සුජීව කුමාර හිමිකම් කියන ගොඩැල්ල පාරේ වරිපනම් අංකය 126/086 දරන ඉඩම,හිමිකම් කියන්නා සහ ඉඩමේ නම සොයාගත නොහැකි ඉඩම, එම්.පී.ප්‍රියන්ත කුමාර හිමිකම් කියන ගොඩැල්ල පාරේ වරිපනම් අංකය සහ ඉඩමේ නම සොයාගත නොහැකි ඉඩම සහ අංගොඩ, මුල්ලේරියාව උතුර,බෝධිය පටුමගේ අංක 55G හි පදිංචි හපුආරච්චිගේ සමාධි නිරෝෂණී පෙරේරා හිමිකම් කියන ඉඩම; බටහිරට: හිමිකම් කියන්නා සහ ඉඩමේ නම සොයාගත නොහැකි ඉඩම, ඒ.එච්.පී. විමලරත්න හිමිකම් කියන ගොඩැල්ල පාරේ වරිපනම් අංකය සහ ඉඩමේ නම සොයාගත නොහැකි ඉඩම, ජී.සුජීව කුමාර හිමිකම් කියන ගොඩැල්ල පාරේ වරිපනම් අංකය 126/086 දරන ඉඩම,හිමිකම් කියන්නා සහ ඉඩමේ නම සොයාගත නොහැකි ඉඩම එම්.පී.ප්‍රියන්ත කුමාර හිමිකම් කියන ගොඩැල්ල පාරේ වරිපනම් අංකය සහ ඉඩමේ නම සොයාගත නොහැකි ඉඩම සහ අංගොඩ, මුල්ලේරියාව උතුර,බෝධිය පටුමගේ අංක 55G හි පදිංචි හපුආරච්චිගේ සමාධි නිරෝෂණී පෙරේරා හිමිකම් කියන ඉඩම.

EOG 11-0133